08/05/2011 - ලංකාදීප

**කෘෂි යුගයේ සිට තාක්ෂණික යුගය උදාවන විට වෙනස් විය යුතු ආකල්ප - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාව ජගත් ප්‍රජාව සමග පැවති වෙළඳ සම්බන්ධතා ඈත අතීතය දක්වා විහිද යයි. බුදුරජාණන් වහන්සේ ගේ කේෂ ධාතූන් රැගෙන දඹදිව උත්තලා නගරයේ සිට සිට තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ලංකාවට පැමිණි බව පූජාවලියේ සඳහන්ය. ඔවුහු ගොඩ බැස ඇත්තේ ත්‍රිකුණාමලය වෙළඳ වරායටය. මෙම කේෂ ධාතු නිධන් කොට ගිරිහඬු සෑය ඉදි කළ බවත් මෙරට ඉදිවූ පළමු බෞද්ධ සංකේතය ගිරිහඬු මහ වෙහෙර බව සැළකිය හැකි සාධක පවතී. සේද මාවත තවත් වෙළඳ මගකි. පෙරදිග ඔස්සේ වෙළඳුන් පැමිණ මෙරටින් මුතු, මැණික්, ඇත්දල ගෙන ගිය බවට පැහැදිලි සාක්ෂි හමුවෙයි. තවත් කාලයක් මුතු හා මිනිරන් හෙයින් ලංකාව ලෝක අවධානය දිනා සිටියේය. බටහිර යටත් විජිතයක් බවට පත්වූ පසු වැඩි අවධානයක් ගත්තේ කුලුබඩු සම්බන්ධවය. කුරුඳු ගසක් කපා දැමීම මරණීය දණ්ඩනය ලැබිය යුතු තරමේ වරදක් තරමට පෘතුගීසීන් නීති පණවා තිබීමෙන් මෙය සනාථ වෙයි. යටත් විජිත සමයේ මෙරටට පැමිණි වැවිලි කරුවෝ මෙහි ඉඩ කඩම් අත්පත් කරගෙන කෝපි වගා කළහ. අනතුරුව රබර් හා තේ වගා කළෝය. එමෙන්ම ඔවුහු ඉන්දියාවෙන් ලාභ කුළී කරුවන් ගෙන්වා ගත්හ. මේ කෙටි ආපසු හැරී බැලීම පෙන්වන්නේ ශ්‍රී ලංකාව කෘෂි ආර්ථිකයකින් යැපුණ බව දක්වන්නටය. රටට විනිමය ඉපැයීම අතින් ඉහලම කාරණා දක්වන සේ විමසුවහොත් උත්තරය ලෙස ලැබුණේ තේ පොල් හා රබර් යන වචන තුනයි.

ලෝකය වෙනස් වෙමින් තිබේ. නිතිපතාම එහි අභියෝග අලුත්වෙයි. මුහුණුවර වෙනස් වෙයි. වෙනස් වීම් වලට සාර්ථකව මුහුණ දෙන ජාතීන් අතර සිදුවන දියුණුව කැපී පෙනේ. සමාජ අතර ප්‍රගතිය මහජනතාවගේ ජීවිත සැපවත් කරයි. කෘෂිකාර්මික යුගයේ සිට කාර්මික යුගය පසුකර තාක්ෂණික යුගය දක්වා ලෝකය ගමන් කර තිබේ. කෘෂිකර්ම යුගයේ සිට කාර්මික යුගය දක්වා ගමන් කිරීමට පරම්පරා කිහිපයක් ගත විය. තාක්ෂණික යුගයේ දියුණුවට එතරම් කල්ගත්තේ නැත. එහි යථාර්ථය අප අද අත්විඳිමින් සිටින්නෙමු.

තාක්ෂණික දියුණුව හෙයින් තොරතුරු හුවමාරුව වේගවත් වී තිබේ. කෘෂිකාර්මික යුගයේ දී වෙළඳ නැවක් පැමිණෙන්නට හා භාණ්ඩ හුවමාරුවට ගතවූ කාලය සෑහෙන එකකි. අද දත්ත හුවමාරුව ක්ෂණිකව සිදුවෙයි. අමුද්‍රව්‍ය අඩු මිළට ඇති තැන හා ප්‍රවාහනයට ඇති පහසුකම් සොයා ගැනීමට තොරතුරු තාක්ෂණය උපකාරී වෙයි. ලෝකයේ ලාභ ශ්‍රමය ඇති තැන හා ආයෝජනයට පහසුකම් ඇති ප්‍රදේශ බලා ආයෝජකයෝ සංක්‍රමණය වෙති. අඩු වියදමකින් නිෂ්පාදනය කරන්නට හා එකී නිෂ්පාදන අළෙවියට ඇති වෙළඳ පොළ සොයා යාම යනාදී කරුණු විශාල පරිවර්තනයකට මුහුණ දී තිබේ. පරිගනක තාක්ෂණය සමග වේගවත් දත්ත හුවමාරුව එහි ප්‍රධාන බලවේගයයි. වේගවත් තොරතුරු හුවමාරුව, භාන්ඩ ප්‍රවාහනයේ වේගවත් බව නිසා සමාජ ගෝලීයකරණය අපට දැනෙන්නට තිබේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන වේගය ද ක්‍රමයෙන් වැඩිවෙමන් ඇත. නමුත් ආකල්ප වෙනස්වීමේ පරිවර්තනය තවමත් ප්‍රමාණවත් නැති බව පැහැදිලිව පෙනේ. මහජනතාවගේ ශ්‍රමය හා සම්බන්ධ ආකල්ප නොවෙනස්ව පැවතීම රටට හිතකර නැත. වර්තමානයේ ශ්‍රී ලංකාව හමුවේ ඇති අභියෝග රැසකි. අධ්‍යාපනය, ආර්ථිකය, ආහාර හා බලශක්තිය යන හැම අංශයක්ම අද අභියෝගයකි. එකක් විසඳාගෙන දෙවැනි ප්‍රශ්නයට මුහුණ දෙන්නට අවස්ථාව සලසා ගැනීමේ අවස්ථාවක් නැත. ප්‍රමුඛතාවය දිය යුතු පවතින සියලුම අභියෝගයන්ටය. ගෝලීයකරණය, පෞද්ගලික ව්‍යවසාය දිරිගැන්වීම වැනි විටින් විට ලෝකයේ ප්‍රතිපත්ති නව්‍ය මුහුණුවරක් ගන්නා විට එයට අනුරූපව වෙනස් වන්නට රාජ්‍ය පාලනයටත්, ප්‍රතිපත්ති සම්පාදකයනුත් සමත්වීම වැදගත්ය.

මෑත භාගය තුළ ලෝකයේ වෙනස්වීම් සමග දකුණු ආසියාව ඇතුලත් පෙරදිග සමාජය විශාල පරිවර්තනයකට ලක්විය. ඇතැම් රටවල සමාජ මෙකී පරිවර්තන හමුවේ ශක්තිමත්ව නැගී සිටියේය. අවශ්‍ය පමණට කැපවීම හා ගැලපෙන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කර ගන්නට සමත්වීම එයට

බලපෑවේය. එම රටවල රාජ්‍ය නායකයන් සමාජයට අවශ්‍ය නායකත්වය ලබා දුන්නේ වෙනස්වන ඉරණමට මුහුණ දීමට සමත් පුළුල් දැක්මක් සහිතවය.

ඉතා බරපතල කැපවීම් හා රෙගුලාසි සහිතව තමන් හමුවට ආ ප්‍රශ්න වලට මුහුණ දුන් ආසියානු රටවල් බොහෝය. මැලේසියාව වර්තමානයේ දියුණු රටකි. ඒ මට්ටමට දියුණු වූයේ ජාත්‍යන්තර ස්වභාවය හඳුනාගෙන ආර්ථිකයේ විශාල වෙනස්කම් කරන්නට මහතීර් මොහමඩ් සමත් වූ නිසාය. සිංගප්පූරුවේ නායක ලී ක්වාන් යූ  කුඩා රටක් වූ සිංගප්පූරුව ලෝකයේ අවධානය දිනා ගන්නා තැනක් බවට පත් කලේය. බ්‍රසීලය ලෝක ප්‍රජාවට ණය ගැති රාජ්‍යයක්ව සිට ජනතා අපවාදයට ලක් වූයේත් පසුව බලයට පත් ලුලා ඩි සිල්වා ගෙන ගිය ව්‍යායාමය නිසා අද වේගවත් සංවර්ධනයක් කරා ළඟාවී ඇත්තේත් සමාජය හා නායකයන් එකතුව ගෙන ගිය ප්‍රතිසංස්කරණ හේතුවෙන්ය. වර්තමාන ඉන්දීය අගමැති මන්මෝහන් සිං එවකට මුදල් ඇමති ලෙස ඉන්දීය ආර්ථිකය සැලසුම් කළේය. ඔහුගේ දැක්ම එදා ඉන්දීය සමාජයේ විරෝධයට හේතු වූ නමුත් ප්‍රතිපල භුක්ති විඳින්නේ අද සමාජයයි. චීනය අද වේගවත් සංවර්ධනයක් පෙන්වන්නේ ගතානුගතිකත්වයෙන් වෙනස් වී නවීන සමාජය සමග බද්ධ වූ හෙයින් බව නිසැකය.

මේ වෙනස කරන්නට සමත් වූයේ නිවැරදි තීරණ නිවැරදි මොහොතේ ගන්නට හැකියාව ලැබීම සමගය. සමාජ යහපත වෙනුවෙන් මහජනතාව අතිශය වේදනා සහගත අත්හ්‍රිකීම් වලට මුහුණ දුන් අවස්ථා ලෝකයේ සංවර්ධිත රටවලින් අසන්නට ලැබේ. ඉන්දියාවේ හෝ මැලේසියාවේ අධිවේගී මාර්ග ඉදිවූයේ මහජන කැමැත්තෙන් ගොවිබිම් පවරා දී ඉතා සාමකාමී අන්දමට නොවේ. ඇතැම් අවස්ථාවල වන්දි ලැබීමකින් තොරව කඳවුරු වලට ගාල්වී දුඛිත ජීවිත ගත කළ මෙම පිරිස් අවසානයේ මීලඟ පරම්පරාව වෙනුවෙන් සමෘද්ධිමත් ජීවිතයක් සඳහා පදනම සකස් කළහ. කැපකිරීමක් කළ පිරිස දුක්බර යුගය නිමාවේ දී සැනසිල්ල ලඟාවන බවක් විශ්වාස නොකරන්නට ඇත.

ශ්‍රී ලංකාව දැන හඳුනාගත යුතු පාඩම එයයි. එක රාත්‍රියකින් සියල්ල වෙනස්කර සුරංගනා ලෝක මවන අවස්ථාවාදී තත්ත්වයන්ට වඩා මහජනතාව විශ්වාසය තැබිය යුත්තේ ප්‍රායෝගිකව පෙන්වන යථාර්ථය දෙසය. යමක් සම්බන්ධයෙන් පෙනෙන සත්‍යය වෙනුවට නොපෙනෙන මිරිඟුව කෙරෙහි ඇලෙන්නට ශ්‍රී ලාංකිකයන් සමත්ය. මේ නිසා විචාරයකින් තොරව වචන ඔස්සේ මංමුලාවෙති. සහනාධාර බලාපොරොත්තු වෙති. ප්‍රශ්න වලට විසඳුම අප විසින්ම නිර්මාණය කරගැනීම අවශ්‍ය බව නොසලකන අතර කවුරුන් හෝ එයට උත්තර සපයනු ඇතැයි සිතති. මෙයින් ප්‍රයෝජන ගන්නේ දේශපාලනඥයන්ය.  තමුන් යළිත් වතාවක් රැවටී ඇති බව දැන ගන්නා විට ප්‍රමාද වී හමාරය.

අද කැපවීමෙන් හෙට යහපත් අනාගතයක් උදා කර ගත හැකිය. වර්තමාන සමාජය කැපවීමකට සූදානම්ද? ඒ කැපවීම කොයිතරම් ගැඹුරු හා අවංක එකක්ද? රට වෙනුවෙන් කැපවීම සම්බන්ධයෙන් විශ්වාසයක් ඔබට තිබේද? මේ කැපවීම හරහා තම දරුවන්ට යහපත් අනාගතයත් උදා කර ගත යුතු යයි ඔබ සිතන්නේද? මේ ප්‍රශ්න වලට සමාජය හමුවට පැමිණ උත්තර බැඳිය යුත්තේ තම තමන්මය. තම දරුවා වෙනත් රටකට යවා උගන්වා එහි පුරවැසි බව ලබා දී ප්‍රශ්නය විසඳිය හැකිය. එය ලෙහෙසි මාවතයි. ඇති හැකි අයගේ සිට මධ්‍යම පාන්තික ශ්‍රී ලාංකිකයන් තොරා ගෙන ඇත්තේ එකී මාවතයි. නමුත් අප තෝරා ගත යුත්තේ අසීරු ගිරි දුර්ග සහිත මාවතය. පවතින සම්ප්‍රදායික රාමුවෙන් රට වෙනස්කර අප සියලු දෙනාගේම අනාගතය ගොඩ නගා ගැනීමයි. එහි කටුක හා දරා ගැනීම අපහසු බව ඇත්තකි. නිසි ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලක් සකස් කර පොදුවේ බෙදා ගන්නට හැකියාව ඇත්නම් දුක්බර වර්තමානයක සිට යහපත් අනාගතයක් දක්වා පරිවර්තනයකට ගත වන්නේ සුළු කාලයකි.

අලුත් අවුරුදු නිවාඩුවෙන් පසු ශ්‍රී ලාංකේය සමාජය යළි වැඩ කරන්නට පටන්ගෙන තිබේ. සතිය අවසන් වන්නට කලින් තවත් නිවාඩුවකි. 2011 වසර ආරම්භ වී ගතවූ මාස හතර ඇතුලත නොයෙකුත් නිල, සමාජ හා සංස්කෘතික කරුණු හා විශේෂ නිවාඩු නිසා වැඩ කරන්නට ඉතිරි වූ දවස් ගණන සීමිත විය. වැඩ කරන ජනතාවට තමන්ට අවශ්‍ය පරිදි ගන්නට වැටුප් සහිත නිවාඩු ද තිබේ. මේ අනුව අවුරුද්දකට ඇති පැය ගණනින් වැඩ කරන පැය ගණන කොපමණද? කෘෂිකාර්මික යුගයේ දී

වගාව අතර ඇති කාලය නිවාඩු ගත හැකි විවේකයට ඉඩ ඇති සමයකි. කාර්මික යුගයේ දී පවා ඉල්ලුම හෝ සැපයුම අනුව වැඩ කරන ජනතාවට කාලය වෙන්කර ගැනීමට අවස්ථාව තිබිණ. එනමුත් අද පසුවන්නේ වේගවත් සමාජයකය. මිලියන කිහිපයක ජනගහනයක් ඇති ශ්‍රී ලංකාව නිවාඩු ගනිමින් රාත්‍රියට වැඩ අත්හරිමින් සිටින අවස්ථාවක ලෝකය පුරා බිලියන ගණනක් ජනතාව වෙහෙසෙමින් වැඩ කරති. නිෂ්පාදනයට හා වෙළඳාමට දායක වෙති. අප රටට මග හැරෙන අවස්ථා ගැන අප උනන්දු නොවන්නේ ඇයි?

පවතින සංකීර්ණ හා තියුණු වෙළඳ පොළ රටාව අනුව භාණ්ඩයක මිළ තීරණය කිරීමේ සාධක අතර ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවයට ඇත්තේ ඉහළ තැනෙකි. අනවශ්‍ය වියදම අඩු කර ඉහළ ගුණාත්මක භාවයකින් යුත් නිෂ්පාදනයකට නම් මෙකී සාධක කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතුය. ගොවිපොලේ සිට වෙළඳ පොල දක්වා හෝ අමුද්‍රව්‍යයක සිට පාරිභෝගිකයා අතට භාණ්ඩයක් පත්වීම දක්වා තියුණු තරඟයක් තිබේ. මේ තරඟයට මුහුණදිය හැකි ශක්තිමත් ශ්‍රම වෙළඳ පොළක් ඇති රටවල් ආර්ථික ශක්තිය ඇත්තන් බවට පත්වෙයි. නිතරම වේගය අවශ්‍යය. පරාජයට පත්වන්නා වෙළඳ පොළේ දී ප්‍රතික්ෂේප වෙයි. ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳාම මුහුණ දී ඇත්තේ ද මෙම යථාර්ථයටය. අවුරුදු පණහකට කලින් මිනිරන් හා ක්‍රේප් රබර් අපනයනය කළ යුගයේ සිට ඇඟලුම් අපනයනය දක්වා පර්වර්තනයක් ඇති වූයේ මෙම ආර්ථික ස්වභාවය සමගය. ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට වෙළඳ පොළ බලවේග සම්පූර්ණයෙන් පාලනය කළ නොහැකිය. විවෘත ආර්ථිකය සාහසික හා අපට නොගැලපෙන එකක් බවට සමාජයේ කොටසක් තුළ විවේචන තිබේ. එහෙත් පරිනාමය හා ස්වභාවික වරණය අනුව නිසි තරඟකාරීත්වය ඇති විවෘත ආර්ථිකය අදට ගැලපෙන ආර්ථික ක්‍රමයක් බව ලෝකයේ රටවල් වැඩි ගණනක් පිළිගැනීමයි.

ලෝකයේ ඉහළින් සිටින්නට හැකිවන්නේ මේ රාමුව අනුව ගමන් කිරීමෙන් පමණකි. එයට අවශ්‍ය පරිසරයට අප හැඩගැසෙන්නට අවශ්‍යය. කෘෂිකාර්මික යුගයේ සිට තොරතුරු තාක්ෂණ යුගය දක්වා ආකල්ප වෙනස් කර ගත යුතු ඒ අනුවය. ලෝක සංස්කෘතිය වෙනස් වන විට ශ්‍රී ලාංකික අනන්‍යතාව හා උරුමය ආරක්ෂාකර ගනිමින් එයට මුහුණ දෙන්නට හැකි පරිසරයක් සකස් කර ගත යුතුය. මෙවැනි ආකල්ප වෙනස් කර ගැනීම අපහසු නැත. කාන්තාව පිළිබඳව දශක කිහිපයකට පෙර තිබුණ ආකල්පය අද සහමුලින්ම වෙනස්ය. අද ආර්ථිකයේ විශාලම බලවේගය කාන්තාවයි. එදා කාන්තාව වැඩ කරන ශ්‍රම බලකාවේ වැඩි පංගුව විය යුතු යැයි මතයක් පළ කළේ නම් එය මහා ආන්දෝලනාත්මක ප්‍රකාශයක් වනු ඇත.

නමුත් අද අප රට වෙනුවෙන් වැඩ පිළිවෙල කුමක්ද? යන්න තීරණය කළ යුතු අවස්ථාව හමුවට පැමිණ තිබේ. වැඩ කරන පැය ගණන කොපමණද? රටට මේ තරම් නිවාඩු අවශ්‍යද? ආගමික, සංස්කෘතික හා වෙනත් ඕනෑම හේතුවක් දක්වමින් පවත්වන උත්සව ප්‍රමාණය කොතරම්ද? ඒවාට ගත කරන කාලය, වැය කරන ධනය යහපත් ප්‍රයෝජනවත් දෙයට යෙදවිය නොහැකිද? යන ප්‍රශ්න වලට අවංකවම අප අපගේම හදවතින් ප්‍රශ්න කළ යුතුය.

තර්ක වලින්, කතා පැවැත්වීමෙන් හෝ උත්සව සාද වලින් රට දියුණු කළ හැකිනම් ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම සංවර්ධන වේගයක් පෙන්වන බව නිසැකය. ආයතන පිහිටුවා, කොමිෂන් සභා පත් කර සංවර්ධනය විය හැකි නම් ශ්‍රී ලංකාවට ඇත්තේ දිව්‍ය ලෝකයක් මවන්නට තරම් හැකි ආයතන, දෙපාර්තමේන්තු හා කොමිෂන් සභා සංඛ්‍යාවකි. ත්‍රස්තවාදය පැවති අන්ධකාර යුගයෙන් පසු අලුත් යුගයකට සේන්දුවන විට ලෝක සමාජයේ අවස්ථා කිහිපයක් පසුවී තිබේ. අප තවමත් පසුවන්නේ කෘෂිකාර්මික සමාජයේය. තාක්ෂණික යුගයේ දී දිවා රාත්‍රියක් නැති, තරඟකාරී වෙළඳ පරිසරයකට මුහුණ දෙන්නට සිදුවෙයි. මේ වෙනුවෙන් කැප වන්නට පරිත්‍යාගශීලී වන්නට සූදානම්ද? දේශපාලන ක්‍රමයේ හෝ අනුන්ගේ දොස් හෝ අනුන් කරන කියන දේ ගැන බලා ද්වේශ කරමින් සිටිනවාද? නිශ්චිත වැඩ පිළිවෙලකට අනුගත වන්නට අභියෝගයක් සේ සලකා අලුතින් මුහුණ දෙන්නට අප සූදානම්ද? මේ සංවාදය අද සමාජයේ තිබිය යුතු එකකි.